*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 17-Iss.I, June 2026, 157-174.*
*DOI: https://doi.org/10.4038/p.v17i1.92*

# විෂ්ණු දශාවතාර සංකල්පයේ විද්‍යාත්මක පදනම

# [The scientific foundation of the concept of Vishnu's Ten Avatars ]

**Kaluwane Kumarakassapa[1]**

**Abstract**

In the Hindu tradition, the Trimurti — Brahma, Vishnu, and Maheshvara (Shiva) — is a principal concept. In this triad, Brahma is regarded as the creator of the world. Vishnu is the preserver who sustains the world properly. The destruction of the world is attributed to Ishvara, or Maheshvara (Shiva). Within this concept, Vishnu performs a highly significant role: the preservation of the world. Sustaining the world requires greater attention than creation or destruction; otherwise, the world would face destruction before its appointed time. According to the Vaishnava tradition, the method employed by Vishnu to carry out this function of preservation is through his avatars (incarnations).

The concept of the Dashavatara (Ten Avatars) is first seen in the eighteen Puranas, traditionally believed to have been composed by Vyasa. These texts compile various legends and mythological concepts found in Indian literature. Among this is the concept of Vishnu's ten avatars. The ten avatars of Vishnu are listed as Matsya (the Fish), Kurma (the Tortoise), Varaha (the Boar), Narasimha (the Man-Lion), Vamana (the Dwarf), Parashurama, Krishna, Rama, Buddha, and Kalki. Of these ten, nine are believed to have already appeared. The only remaining avatar yet to appear is Kalki, who is said to manifest during the Kali Yuga (the present age).

An avatar (incarnation) is understood as a divine manifestation or embodiment of a god descending from the divine realm to the earthly world. These incarnations take birth in the human world to bring about positive change and improve the state of the world. The concept of Avatars is directly associated with Vishnu's character. As the preserver of the world, Vishnu manifests in different forms during various ages when unrighteousness (adharma) becomes powerful, in order to destroy adharma and reestablish righteousness (dharma).

Notably, when examining this popular concept of the Dashavatara, it appears to reflect a gradual progression resembling biological evolution. The tendency to associate the earliest state of the universe with a primordial watery condition is also a characteristic feature of the Indian philosophical tradition.

**Keywords;-** Vishnu, Ten Avatars, Puranas, Hindu tradition, divine manifestation

1. Senior Lecturer, Department of Languages, Bhiksu University of Sri Lanka.
E-mail: kasspa@busl.ac.lk https://orcid.org/0009-0003-5340-6805

Received: 15 February 2026, Accepted revised version: 10 May 2026.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

### හැඳින්වීම

හින්දු සම්ප්‍රදායේ බ්‍රහ්ම, විෂ්ණු, මහේෂ්වර යන ත්‍රිමූර්තිය ප්‍රධාන සංකල්පයකි. එහි බ්‍රහ්ම යනු ලෝකය නිර්මාණය කරන්නා ය. විෂ්ණු යනු ලෝකය මනාව පවත්වාගෙන යන්නා ය. ලෝකයේ විනාශය පමුණු වන්නේ ඊශ්වර හෙවත් මහේෂ්වරයා ය (රණසිංහ, 2016: 01). මෙම සංකල්පයේ විෂ්ණු වැදගත් මෙහෙවරක් කරයි. එනම් ලෝකය පවත්වාගෙන යෑම යි. නිර්මාණයට හෝ විනාශයට වඩා වැඩි අවධානයකින් පවත්වාගෙන යෑම සිදු කළ යුතු ය. නොමැති නම් නියමිත කාලයට පෙර ලෝකයේ විනාශය ඇති වේ. එකී පාලනය සිදු කිරීම පිණිස විෂ්ණු විසින් යොදා ගන්නා ලද උපක්‍රමය නම් මෙම අවතාර බව වෛෂ්ණව සම්ප්‍රදායේ පිළිගැනීමයි.

වෛෂ්ණව සම්ප්‍රදාය තුළ විෂ්ණු දෙවියන්ට ප්‍රමුඛත්වය හිමිවෙයි. ඔවුන් විශ්වාස කරනුයේ විෂ්ණු උත්තරීතර වන අතර බ්‍රහ්ම සහ ශිව විෂ්ණුගේ විවිධ ශක්තීන්ගේ ප්‍රකාශයන් බව යි. එසේ ම බ්‍රහ්මට සහ ශිවට ඔවුහු ගරු බුහුමන් දක්වති.

දශාවතාර සංකල්පය ප්‍රථමයෙන් දැකිය හැකි වන්නේ ව්‍යාස විසින් රචිතැයි සැලකෙන අටලොස් (18) පුරාණ ග්‍රන්ථයන්හි ය. නමුත් මෙම පුරාණ ග්‍රන්ථ ක්‍රි.ව. 02-13 අතර කාලය තුළ විවිධ ආචාර්ය පරම්පරා යටතේ රචනා වන්නට ඇතැයි යන්න, ප්‍රසිද්ධ විද්වත් මතයකි. (Dating of the Puranas) (Accessed: 24 June 2025) ඊට ප්‍රථමයෙන් මෙම පුරාණ මුඛ පරම්පරාවෙන් පැමිණි බව පිළිගැනේ. භාරතීය සාහිත්‍ය තුළ දැක්වෙන ජනප්‍රවාද සහ මිථ්‍යා සංකල්ප ආදිය මේවායෙහි සංගෘහිත වී ඇත. ඒ අතර එන සංකල්පයක් ලෙස මෙම විෂ්ණු දශාවතාර සංකල්පය පෙන්වා දිය හැකි ය. මෙම පුරාණ තුළ බුද්ධාවතාර සංකල්පය ක්‍රි.ව. 06 වන සියවසෙන් පසුව ව්‍යාප්ත වූ බව පෙනේ. මෙහි දී හින්දු සංකල්පය බෞද්ධ සංකල්පය අවශෝෂණය කර ගෙන ඇත. මෙම පුරාණ අතුරින් භාගවත, අග්නි, ගරුඬ, ලිංග, හරිවංශ ආදි පුරාණ බුද්ධාවතාර සංකල්පය විස්තර කරන ප්‍රධාන මූලාශ්‍රයෝ වෙති. එසේ ම ක්ෂේමේන්ද්‍රගේ දශාවතාරචරිතය, ජයදේවගේ ගීතගෝවින්දය වැනි ග්‍රන්ථ තුළ ද මෙම දශාවතාර සංකල්පය විස්තර කෙරේ.

මෙකී ග්‍රන්ථවලින් පමණක් නො නැවතුණු මෙම සංකල්පය ශිලාලේඛන දක්වා විකාශනය වී ඇති ආකාරය ද හඳුනාගත හැකි ය. තමිල්නාඩුවේ මාමල්ලපුර, ආදිවරාහ ගුහාවේ ඇති පල්ලව අක්ෂරයෙන් රචනා වූ ශිලා ලේඛනය ඒ බව තහවුරු කරයි. 08වන සියවසට අයත් බව සැලකෙන මෙහි දශාවතාර පිළිබඳ ව සඳහන් වේ. එහි ඇති ශ්ලෝකය මේ ලෙස දැක්විය හැකි ය (රණසිංහ, 2016: 29).

''මත්ස්‍ය කූර්මඃ වරාහශ් ච නරසිංහාශ් ච වාමනඃ

රාමෝ රාමශ්ච බුද්ධඃ කල්කී දශස්ථිතඃ''

එයට අනුව විෂ්ණු දශාවතාර ලෙස **මත්ස්‍ය, කූර්ම, වරාහ, නරසිංහ, වාමන, පරශුරාම, කෘෂ්ණ, රාම බුද්ධ, කල්කි** යන අවතාර දහය දක්වා ඇත. මෙම අවතාර දහයෙන් නමයක් මේ වනවිට පහළ වී අවසන් ය. තවත් පහළ වීමට ඇත්තේ කල්කි නම් අවතාරය පමණි. එය පහළ වන්නේ කලියුග කාලයේ බව දැක්වේ. එසේ ම ජයදේවගේ ගීත ගෝවින්දයේ මෙම අවතාරවලට අනන්‍ය විශේෂතා ද දක්වා ඇත.

අවතරණ හෙවත් අවතාර යනු දෙව්ලොව සිට මෙලොව පැමිණෙන දෙවියෙකුගේ ශක්ති ප්‍රභවයකි. ප්‍රතිරූපයකි. අවතාර ලෙස මිනිස් ලොවට පැමිණෙන්නේ ලෝකය පවත්නා තත්වයට වඩා යහපත් කොට වෙනසක් ඇති කිරීම උදෙසා ය. අවතාර සංකල්පය සමග ඍජුව සම්බන්ධ වන්නේ විෂ්ණු චරිතය යි. ඉහත කී ලෝක පාලක විෂ්ණු අධර්මය බලවත් යුගවල දී, අධර්මය

විනාශ කොට ධර්මය ප්‍රතිෂ්ඨාපනය කිරීම පිණිස විවිධ යුගවලදී විවිධ ස්වභාවයන්ගෙන් පෙනී සිටියි. ඒ බව පහත සඳහන් හරිවංශ උද්ධෘතයෙන් පැහැදිලි වේ. එහි ''ප්‍රාණීන්ද්‍රගේ ප්‍රධානියා වූ විෂ්ණු ලෝවැඩ හිතසුව පිණිස පොළොවට අවතීර්ණ වූ ආකාරය අසන්න යැයි'' දක්වති.

''යදා යදාහි ධර්මස්‍ය ශ්ලානිර්භවති භාරත

ධර්ම සංස්ථාපනාර්ථාය තදාසම්භවති ප්‍රභූම්''

## 2. පර්යේෂණයේ වැදගත්කම

විශේෂයෙන් මෙම ප්‍රචලිත දශාවතාර සංකල්පය විමර්ශයේ දී පෙනී යන්නේ, සත්ත්ව පරිණාමයේ ක්‍රමික විකාශනයක් ඉන් ප්‍රකට වන බව යි. විශ්වයේ මූලමය තත්ත්වය, ජලමය තත්ත්වයක් සමඟ සම්බන්ධ කිරීමේ රුචිකත්වය සහ ප්‍රවණතාව, භාරතීය චින්තන සම්ප්‍රදායේ උරුමයකි. ඍග්වේදයේ එන නාසදීය, හිරණ්‍යගර්භ වැනි සූක්තත් මනුස්මෘතිය වැනි ධර්ම ශාස්ත්‍ර ග්‍රන්ථත් බෞද්ධ සම්ප්‍රදායට අයත් සූත්‍රපිටකයේ අග්ගඤ්ඤ සූත්‍රය වැනි සූත්‍ර අනුවත් විශ්වයේ ආරම්භය ජලමය තත්ත්වයක් හා සම්බන්ධ වෙයි. දශාවතාරවල පළමුවැන්න වන මීනාවතාරය සම්බන්ධ වන්නේ ජලයට යි. දෙවනුව කූර්මාවතාරය (ඉදිබුවා) ලෙස පරිණාමයට පත් ව ජලයත් ගොඩබිමත් සම්බන්ධ කරයි. තෙවන අවස්ථාවේ දී වරාහ අවතාරය ලෙස ගොඩබිම පමණක් සරන සත්ත්වයකු බවට පත් වෙයි. නරසිංහාවතාරය ලෙස ප්‍රචලිත සිව්වන මූර්තිය, සත්ත්ව හා මිනිස් යන ජීව කොට්ඨාස දෙකේ සංකලනයකි. මෙම සත්ත්ව ස්වභාවයෙන් මිනිස් ස්වභාවය වෙත වන පරිණාමය සිහිපත් කරවන අතර, නොදියුණු තත්ත්වයක සිට දියුණු තත්ත්වයක් බවට පත්වීම පිළිබඳ අදහස ද ජනිත කරවයි. වාමන අවතාරය උසින් අඩු කුඩා මිනිසෙකි. ඔහු සත්ත්ව ස්වරූපයෙන් විනිර්මුක්ත ය. ශරීරයෙන් වර්ධනය වූ බලවත් මිනිසා හමුවන්නේ, සයවනුව එන පරශුරාමාවතාරය මඟිනි. ඊටත් වඩා පරිණාමය වූ බුද්ධිමත් ප්‍රබල මනුෂ්‍යයා එන්නේ අනතුරුව යි. ඒ සත්වන අවතාරය වන රාම ලෙසිනි. තදනන්තර ව එන කෘෂ්ණාවතාරය ද රාමාවතාරය සෙයින් ම බුද්ධියත් ශක්තියත් යන දෙකේ සංකලනයකි. මෙයි නික්බිති ව මිනිස් බුද්ධි පරිණාමයේ විශිෂ්ටත්වය පිළිබඳ සාක්ෂි දරමින් නවවන අවතාරය ලෙස බුද්ධාවතාරය දැක්වෙයි. දස වැන්න තවමත් පහළ වී නැත. දුෂ්ට විනාශය සහ ධර්ම සංස්ථාපනය පිණිස කල්කී අවතාරය නමින් පහළ වන බව සඳහන් වේ. විශ්ව නිර්මාණ ක්‍රියාවලිය දශාවතාර පහළ වීම සම්බන්ධ කරමින් 'මොනියර් විලියම්ස්' දක්වන අදහස සැලකිය යුතුය. (රණසිංහ, 2016: 15-16).

## 3. සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණයට අදාළ මූලික කෘතීන් ලෙස පුරාණ ග්‍රන්ථ සැලකිය හැකි වුව ද එහි සමස්ත අධ්‍යයනයක් කිරීම උගහට ය. එහි දී භාගවත, අග්නි, ගරුඬ, ලිංග හා හරිවංශ ආදි පුරාණ ග්‍රන්ථවල අන්තර්ගත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලබන අතර ක්ෂේමේන්ද්‍ර ආචාර්යවරයා විසින් රචිත දශාවතාර චරිතම් කෘතිය ද ජයදේවයන්ගේ ගීත ගෝවින්දය ද මෙම සාහිත්‍ය විමර්ශනයට උපස්තම්භක විය.

සිංහල භාෂාවෙන් කරන ලද පර්යේෂණ ලිපි කිහිපයක් දක්නට ලැබේ. ඒ අතර ඊරියතොට පාලිත හිමියන් විසින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථී ශාස්ත්‍රීය සංග්‍රහට ලියන ලද 'දස අවතාර සංකල්පයෙන් ගම්‍යවන ජීව පරිණාම වාදය' පර්යේෂණ පත්‍රිකාව මෙම පර්යේෂණයේ අරමුණු සාධනය කරගැනීම සඳහා අතිශයින් වැදගත්ය. නවගමුවේ රේවත හිමියන්ගේ 'භගවත්ගීතාවේ දැක්වෙන අවතාර සංකල්පය' පර්යේෂණ පත්‍රිකාව ද සාහිත්‍ය විමර්ශනයේ දී වැදගත් ය.

**4. පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ තේමා විශ්ලේෂණ හා සංධාර පර්යේෂණ ක්‍රමය මෙහි දී උපයුක්ත කරගනු ලැබේ.

**5. පර්යේෂණයේ අරමුණු**

මෙම පර්යේෂණය සිදු කිරීම සඳහා හේතුවූ කරුණක් වන්නේ අනාදිමත් කාලය සිට විෂ්ණු දෙවියන් පිළිබඳ පවතින විශ්වාසය වර්තමානය තෙක් පැවතීමටත් සිංහල බෞද්ධ සමාජය තුළ ද විශේෂ ගෞරවයට පූජාවට පත්වීමත් නිසා ය. ඒ අනුව මෙම පර්යේෂණය සඳහා අරමුණු ලෙස,

විෂ්ණු දෙවියන් අවතාර වශයෙන් යොදා ගැනීමට හේතුවූ පදනම

දශාවතාර සංකල්පය විග්‍රහ වූ ආකාරය

දශාවතාර සංකල්පය හා බැඳුණු ජීව පරිණාමය පිළිබඳ ක්‍රමික විකාශනය

යන මෙම කරුණු අධ්‍යයන කිරීම යි.

**6. පර්යේෂණ ගැටලුව**

විෂ්ණු දශාවතාර පෙළ ගැසීමේ ක්‍රමික විකාශනය තුළ ජීව පරිණාමය පිළිබඳ අදහසක් ලබාදේ ද?

**7. පර්යේෂණ සීමා**

විෂ්ණු දශාවතාර පිළිබඳ ව සංක්ෂිප්ත විමර්ශනයක් සිදු කෙරෙන බැවින් එක් එක් පුරාණ ග්‍රන්ථයන්හි සඳහන් සෑම තොරතුරක් ම යොදා ගැනීමට නොහැකි ය. ඒ අනුව සීමිත පුරාණ ග්‍රන්ථ කිහිපයක තොරතුරු ද ක්ෂේමේන්ද්‍ර ආචාර්ය වරයාගේ දශාවතාර චරිතම් කෘතියේ සඳහන් විස්තරය ද පමණක් යොදා ගැනීමත් එම තොරතුරු සාරාංශයක් ලෙස දැක්වීමත් මෙහි දී සිදු කෙරේ.

**8. සාකච්ඡාව**

හින්දු ආගම ප්‍රධාන වශයෙන් **ශෛව, ශාක්ත, ස්මාර්ථ, වෛෂ්ණව** යනුවෙන් නිකායන් සතරකි. මේ අතුරින් වෛෂ්ණව සම්ප්‍රදායට ප්‍රධාන තැනක් හිමි වේ. ඔවුන්ට අනුව විෂ්ණු පරම දෙවියා ය. ඉහත නිකායන්ගෙන් සංගෘහිත වී ඇති හින්දු ආගම බ්‍රහ්ම, විෂ්ණු මහේෂ්වර යන ත්‍රිමූර්තිය පිළිගන්නා අතර බ්‍රහ්ම ලෝකය මවයි. විෂ්ණු පවත්වාගෙන යයි. මහේෂ්වර විනාශය පමුණුවයි. මෙකී ත්‍රිමූර්තිය අතුරින් ඍග්වේදයේ පූජාවට පාත්‍රවන්නේ විෂ්ණු පමණක් වීම වෛෂ්ණව මතයට තව දුරටත් සනාථ කිරීමක් වේ. ඒ සඳහා ඍග්වේදයේ 7 මණ්ඩලයේ 99 සූක්තයේ ඍච් පාඨ හතක් දැක්වේ. එහෙයින් විෂ්ණු සංකල්පය ඍග්වේද සමයේ සිට පැමිණි බව පෙනේ.

වෛෂ්ණවයන්ට අනුව ලෝක පාලක විෂ්ණු ලෝකයේ ප්‍රවර්ථනය පිණිස විවිධ ස්වරූපවලින් මනු ලොවට පැමිණේ. එහි පැමිණීම අවතාර ලෙස හෝ අවතරණ වශයෙන් හැඳින්වෙන බව පෙර දක්වන ලදි. **මත්ස්‍ය, කූර්ම,** වරාහ, **නරසිංහ,** වාමන, **පරශුරාම, කෘෂ්ණ,** රාම, **බුද්ධ, කල්කී** යන දශාවතාර විග්‍රහයට පෙර වෛෂ්ණව සම්ප්‍රදාය හා අවතාර සංකල්පයේ විකාශනය කෙටියෙන් හඳුනා ගැනීම වැදගත් වේ.

හින්දු ආගමේ ප්‍රධානතම හා ප්‍රචලිතම නිකාය වශයෙන් හැඳින්විය හැක්කේ වෛෂ්ණව නිකාය යි. භක්තිය මූලික හරය කරගත් මෙහි විෂ්ණු පරමාත්මය යි. පරම දෙවියායි. එම පරම දෙවියා කෙරෙහි ඇති කරගන්නා ප්‍රේමණීය භක්තිමත් භාවය මෝක්ෂය ලැබීමේ මාවත ලෙස විස්තර කෙරේ. භක්තිමත් භාවය නිසා ම විෂ්ණු අතිශයෙන් පූජනීය වී ඇත. මෙලොවට පැමිණෙන විෂ්ණුගේ අවතාර ස්වභාවයන් ද ඒ ආකාරයෙන්ම පූජනීය වේ. නරසිංහ, කෘෂ්ණ, රාම ආදීන් එයට කදිම නිදසුනකි.

අවතාර සංකල්පයේ ආරම්භක අවස්ථාව

පිළිබඳ නිශ්චිත කාලයක් සඳහන් කළ නොහැකි අතර පසු වෛදික යුගයේ මෙම සංකල්පය ජනශ්‍රැති ලෙස වර්ධනය වී බ්‍රාහ්මණ ග්‍රන්ථ සාහිත්‍යයට ඇතුළු වී ඇති බව පෙනේ. ශතපත බ්‍රාහ්මණය ඒ අතර ප්‍රධාන වේ. වෛදික සංස්කෘතයේ බ්‍රාහ්මණ යුගයෙන් පසු කාලයේ ක්‍රි.පූ, 7-6 සියවස්වලට අයත් මෙහි මධ්‍යන්දි හා කණ්ව පරම්පරා දෙකට අයත් ඉගැන්වීම් අන්තර්ගත වෙයි. යාඥවල්ක්‍ය ශුක්ල යජුර්වේදයට කළ අටුවාව වන ශතපත බ්‍රාහ්මණයෙහි **මත්ස්‍ය, කූර්ම, වරහ, නරසිංහ, වාමන** යන අවතාර පහක් විස්තර කරයි. එයින් පසුව වීරකාව්‍යයන් ලෙස සැලකෙන **මහාභාරතය** කන්සා නැසුමට පැමිණි කෘෂ්ණ පිළිබඳවත් **රාමායණය** රාවණා නැසුමට පැමිණි රාම පිළිබඳවත් විස්තර කරන අතර ඔවුන් විෂ්ණුගේ අවතාර බව ප්‍රකාශ කෙරේ. වෛෂ්ණව අදහස් යටතේ අවතාර සංකල්පය ප්‍රවර්ධනය වී ඇති ආකාරය එයින් හඳුනාගත හැකි ය.

ප්‍රථමයෙන් විෂ්ණු දශාවතාර සංකල්පය හමුවන්නේ ව්‍යාස විසින් රචිත යැයි සැලකෙන අටළොස් පුරාණ ග්‍රන්ථ සාහිත්‍යය මඟිනි. එහෙත් මේවා ක්‍රි.ව. 2-13 අතර කාලය තුළ විවිධ ආචාර්ය පරම්පරාවන් යටතේ රචනා වූ බව ප්‍රසිද්ධ විද්වත් මතය යි. ඊට ප්‍රථමයෙන් මුඛ පරම්පරාවෙන් පැමිණි මෙම පුරාණ ජනශ්‍රැති බව හඳුනාගත හැකි ය. විෂ්ණු පුරාණය වෛෂ්ණවයන්ගේ ප්‍රධාන ඉගැන්වීම් ග්‍රන්ථයක් වන අතර අවශේෂ පුරාණ ද මෙයට ඇතුළත් වේ. **බ්‍රහ්ම, පද්ම, විෂ්ණු, භාගවත, අග්නි,** වරාහ, **වාමන, කූර්ම, මත්ස්‍ය, බ්‍රහ්මවෛවර්ථ** යන ප්‍රධාන පුරාණයන් ද **වායු, හරිවංශ, බෘහන්නාරදීය, විෂ්ණු ධර්මෝත්තර, බෘහද්ධර්ම** ආදි උප පුරාණ ද ඒ අතර වෙයි. මෙකී පුරාණ, උපපුරාණවලින් පසු මෙම දශාවතාර සංකල්පය ඉතා තදින් ජනගත වී ඇති ආකාරය පෙනේ. ශතපත බ්‍රහ්මණය අවතාර පහක් දක්වන අතර, අග්නි- ගරුඬ ආදි පුරාණයන්ට අනුව අවතාර අප්‍රමාණය.

**''අවතාරා අසඞ්ඛ්‍යාතා අතීතානාගතාදයඃ''**

(Dwivedi. Agnipuranam, Chapter-16, Verse 12. Pdf 44. Book 30)

(අතීතයෙහි සහ අනාගතයෙහි ආදි වූ, විෂ්ණු දෙවියන්ගේ අවතාරයන් ගණින් කළ නොහැකි තරම් අසංඛ්‍යාත ය.)

**''අවතාරාඛ්‍යසඞ්ඛ්‍යයො හරෙඃ**
**සත්ත්වනිධේර්ද්විජඃ''**

(Pandey; Garudapurana; 1.34: Pdf 30. Book 2)

(මුනිවරුනි, සැබවින් ම පිරිසිදු ගුණයේ නිධානය වූ හරි (විෂ්ණු) දෙවියන්ගේ අවතාර අසංඛ්‍යාත ය.)

එහෙත් මේ පිළිබඳ ව අධ්‍යයනය කළ 'චාල්ස් එලියට්' දක්වන්නේ විෂ්ණු ලොව පහළ වන අවතාර රූප **තිස් නවයක්** ඇති බව යි. ඒ අතුරින් දහයක් ප්‍රධානව විකාශනය වී ඇත. දශාවතාර ප්‍රධාන වුවත් මුලින් ම පහළ වූ අවතාරය මේ අතර නොමැත. ගරුඬ පුරාණය එය මෙසේ විස්තර කෙරේ.

**''හරිඃ ස ප්‍රථමං දෙවඃ කෞමාරං සර්වමාස්ථිතඃ**

**චචාර දුශ්චරං බ්‍රහ්මන්**
**බ්‍රහ්මචර්යමඛණ්ඩිතම්''**

(Pandey, P. S. R. ; Garudapurana; 1.14 : Pdf 30. Book 2)

(ඒ හරි (විෂ්ණු) දෙවියෝ පළමුවරට **කෞමාර** ස්වරූපය සම්පූර්ණයෙන් ම ලබාගෙන, අඛණ්ඩව, පැවැත්වීමට ඉතා අපහසු වූ බ්‍රහ්මචර්යාව පරිපාලනය කළහ.)

විෂ්ණු යන වචනයෙන් දෙවියෙක් පිළිබඳ හැඳින්වෙන අතර අවතාර සමඟ නිතර සම්බන්ධ වේ. මෙහි නිරුක්තිය විමසා බැලීම වැදගත් වේ. විෂ්ණු යන වචනයට පැහැදිලි අර්ථයක් ලබා ගැනීම අසීරු ය.

මෙම වචනයේ මූල ධාතුව ''විෂ්'' වන අතර එහි ක්‍රියාකාරීත්වය, **වේගය, ගලා යෑම, පැතිරී පැවතීම, වෙන්ව තිබීම** යන අරුත් ගම්‍ය වේ. විෂ්ණුගේ ස්වභාවය සමඟ මෙම අර්ථයන් අතුරෙන් ක්‍රියාකාරිත්වය, පැතිර පැවතීම, සහ වෙන්ව පැවතීම යන අරුත් වඩාත් සමාන වේ. (රණසිංහ, 2016: 05) විෂ්ණු ස්වභාවය පිළිබඳ ව ගරුඩ පුරාණ ආරම්භක ශ්ලෝකයේ පහත පරිදි හඳුන්වා ඇත.

**''අජමජරමනන්තං ඥානරූපං මහාන්තං ශිවමමලමනාදි භූතදෙහාවිහීනම්**

**සකලකරණහීනං සර්වභූතස්ථිතං තං හරිමමලමමායං සර්වගං වන්ද එකම්''**

(Pandey, P. S. R. ; Garudapurana; 1.1 : Pdf 29. Book 1)

(උපතක් නැති, දිරායාමක් නැති, සීමා රහිත වූ, ඥානමය ස්වරූපය කොට ඇත්තා වූ, ශ්‍රේෂ්ඨ වූ, ශුභ වූ, කිලිටි නැති, ආරම්භයක් නැති, පංචමහා භූතයන්ගෙන් හා දේහයන්ගෙන් තොර වූ, සියලු ඉන්ද්‍රියයන්ගෙන් තොර වූ, නමුත් සියලු සත්ත්වයන් තුළ වැඩ සිටින්නා වූ, එම නිර්මල, මායාවෙන් තොර, සර්ව ව්‍යාපී වූ එකම හරි (විෂ්ණු) දෙවියන්ට මම නමස්කාර කරමි.)

ඍග්වේදයෙන් ඇරඹී විෂ්ණු සංකල්පයෙන් පසුව ප්‍රවර්ධනය වූ අවතාර සංකල්පය බ්‍රාහ්මණ ග්‍රන්ථ, වීරකාව්‍ය, පුරාණ මගින් විකාශනයට පත්ව ඇත. පසුව ලෞකික සංස්කෘතයෙන් රචිත සාහිත්‍යයට ද එම සංකල්පය පැමිණි බව පෙනේ. ඒ අතර ක්ෂේමේන්ද්‍රගේ '**දශාවචරිතම්**' භක්තිකාව්‍ය ද ජයදේවගේ '**ගීතගෝවින්ද**' ද ප්‍රධාන වේ. ගීතගෝවින්දයේ දස අවතාර සඳහා වෙන් වූ ශ්ලෝක දොළහක් ඇති අතර දොළොස් වෙනි ශ්ලෝකයේ සියල්ල සංක්ෂිප්ත කරමින් විස්තර කොට ඇත. එහි දී දශාවතාරයන්ට අනන්‍ය කාර්යය හා විශේෂතාව දක්වනු ලැබේ. කෘෂ්ණ භක්තික වූ ජයදේව විසින් ඒවා විෂ්ණුට අයත් අවතාර වශයෙන් නොව කෘෂ්ණට අයත් අවතාර බව විස්තර කරනු ලැබේ. කෘෂ්ණ යනු විෂ්ණුගේ අවතාරයක් බව පෙර දක්වන ලදි.

**''වේදානුද්ධරතෙ ජගන්නිවහතෙ භූගොලමුද්බිභ්‍රතෙ**

**දෛත්‍යං දාරයතෙ බලිං ඡලයතෙ ක්‍ෂත්‍රං ක්‍ෂයං කුර්වතෙ**

**පෞලස්ත්‍යං විශතෙ හලං කලයතෙ කාරුණ්‍යමාතන්වතෙ**

**ම්ලේච්ඡාන් මූර්ච්ඡයතෙ දශාකෘතිකෘතෙ කෘෂ්ණාය තුභ්‍යං නමඃ''**

(Jayadeva (1899) The Gita Govinda. 8.12 Pdf 42. Book 17)

(වේදය දරනු ලැබූ, ලොව උසුලා ගත්, පොළොව දරනු ලැබූ, අසුරයන් විනාශ කළ බලි අසුරයා පරාජය කළ, දුෂ්ට ක්‍ෂත්‍රිය අධිපතියන් දුර්වල කළ, නගුල දැරූ, රාවණ පරාජය කළ, කරුණාව පැතිර වූ, ම්ලේච්ඡයන් මුසපත් කරන්නා වූ, අවතාර දහයක ස්වරූපය ගත් කෘෂ්ණ දෙවියන්ට නමස්කාර වේ වා.)

ඉහත ශ්ලෝකයට අනුව අවතාර හා එහි විශේෂතා මේ අයුරින් පෙළ ගැස්විය හැකි ය.

මීන - වේද දරයි.

කච්චප/කූර්ම - ලොව උසුලයි.

සූකර/වරාහ - පොළොව දරයි.

නරසිංහ/නරහරි - අසුරයන් විදාරණය කරයි.

වාමන - බලි අසුරයා නසයි.

පරශුරාම/ භූ භූපති - කැත් ගණ ක්‍ෂය දරයි.

කෘෂ්ණ/ හලදර - නගුල දරයි.

රාම/ පසු පති - රාවණ පරදවයි.

බුද්ධ - කරුණාව පතුරවයි.

කල්කි - මිලේච්ඡයන් මුසපත් කරයි. (රණසිංහ, 2016: 08)

**වේද සාහිත්‍ය, වීර කාව්‍ය සාහිත්‍ය, පුරාණ සාහිත්‍ය, ලෞකික සංස්කෘත සාහිත්‍ය** තුළ පමණක් නොව ශිලා ලේඛන දක්වා ද මෙම අවතාර සංකල්පය ව්‍යාප්ත වී ඇති බව පෙනේ. ක්‍රි.ව. 08 සියවසට අයත් තමිල්නාඩුවේ මාමල්ලපුර ආදි වරාය ගුහාවේ ඇති පල්ලව ග්‍රන්ථාක්ෂරයෙන් රචනා වූ ශිලා ලේඛනය එයට සාධක සපයයි. එම ශ්ලෝකය පහත පරිදි වේ.

**''මත්ස්‍යඃ කූර්මඃ වරාහශ් ච නරසිංහාච් ච වාමනඃ**

**රාමෝ රාමශ්ච රාමශ්ච බුද්ධඃ කල්කී දශස්ථිතඃ''** (රණසිංහ, 2016: 29)

මේ ආකාරයෙන් අවතාර සංකල්පයෙන් දශාවතාර සංකල්පය විකාශනය වූ ආකාරය හඳුනාගත හැකි ය. වර්තමානය වන විට මෙම දශාවතාර සංකල්පය හින්දූන්ගේ ප්‍රධාන පිළිගැනීමකි. එහෙයින් එම අවතාර දහය පිළිබඳ ව කෙටියෙන් හඳුනා ගැනීම වැදගත් වේ. ආගමික සංකල්පය මත පදනම් ව මෙම තොරතුරු විස්තර වේ.

පළමු අවතාරය ලෙස හැඳින්වෙන ''**මත්ස්‍ය**'' ජල ගැල්මක් ඇතිවී ලෝකය විනාශ වන්නට ආසන්න වෙද්දී ඒ බව මනුට දැනුම් දී, පසුව එය සිදු වන අවස්ථාවේ තම හිසේ ඇති අඟට නැවක් සවිකොට මනුත් ඔහුගේ පවුලත් සප්ත මහා ඍෂිවරුනුත් වේදයත් මහා ජලගැල්මෙන් බේරා ගත්තේය. පසුව ''**හයග්‍රීව**'' නම් අසුරයා විනාශ කරන ලදි.(පාලිත හිමි, 2015: 230).

අග්නි දෙවියන් විසින් ම ප්‍රකාශ කර ඇති බව කියවෙන දශාවතාර ස්වභාවය අග්නි පුරාණයේ 49 අධ්‍යායයේ විස්තර වේ. වර්තමානයේ ප්‍රතිමා ආදිය නිර්මාණය කොට ඇත්තේ ද ඒ ආකාරයෙන් බව පෙනේ. පහත එක් එක් අවතාරය විස්තර කිරීමේ දී අග්නි පුරාණ උධෘත දක්වනු ලැබේ. ඒ අනුව මත්ස්‍ය සහ කූර්ම පිළිබඳ ව පහත ශ්ලෝකය අවබෝධය ලබා දෙයි.

**''දශාවතාරං මත්ස්‍යාදිලක්ෂණං ප්‍රවදාමි තෙ**

**මත්ස්‍යාකාරස්තු මත්ස්‍යඃ ස්‍යාත් කූර්මඃ කූර්මාකෘතිර්භවේත්''**

(Dwivedi. Agnipuranam, Chapter-49, Verse 1. Pdf 116. Book 102 )

(මත්ස්‍ය ප්‍රධාන කොට ඇති දස අවතාරයන්ගේ ලක්ෂණ මම ඔබට කියමි. මත්ස්‍ය අවතාරය මත්ස්‍යයකුගේ ස්වරූපයෙන් ම සිටිය යුතු අතර, කූර්ම (කැස්බෑවා) කැස්බෑවකුගේ ස්වරූපයෙන් ම සිටිය යුතු ය.

''**කූර්ම**'' හෙවත් දෙවන අවතාරය කැස්බෑවෙකි. මහා ජලගැලීමේ දී මහත් ආනුභාව සම්පන්න දෙවියන්ගේ බොහෝ වස්තු ප්‍රමාණයක් අතුරුදහන් විය. දෙවියන්ගේ අමරණීයත්වය ඇතිකරන අමෘතය ද ඒ අතර විය. කැස්බෑවෙකුගේ වෙසගත් විෂ්ණු මුහුදු පතුලේ කිමිද මන්දාර පර්වතය සහ දෙවියන් පිටමත තබාගෙන වාසුකී නාග රාජයා පර්වතය වටා ඔතා ක්ෂීර සාගරය කලඹන්නට විය. එවිට අමෘතය ඇතුළු නැතිවූ බොහෝ වස්තූන් නැවත ඇති විය. එහි දී අමෘතය ආදිය පැහැර ගැනීමට බලා සිටි අසුරයන් පරාජය කිරීමට කටයුතු කරන ලදි (පාලිත හිමි, 2015: 230).

''**හිරණ්‍යාක්ෂ**'' නම් අසුරයා පොළොව හෙවත් භූ දේවිය පැහැරගෙන මහා සාගරයේ ගිල්වා සිරකරන ලදි. ''**වාරාහ**'' වේශයෙන් පැමිණි තෙවන අවතාරය භූ දේවිය බේරාගෙන ''**හිරණ්‍යාක්ෂ**'' අසුරයා

පරාජය කරන ලදි. (පාලිත හිමි, 2015: 231)

**''නාරාඞ්ගො වාථ කර්තවෙ‍්‍යා භූවරාහො ගදාරිභෘත්**

**දක්ෂිණේ වාමකෙ ශඞ්ඛ ලක්ෂ්මීර්වා පද්මමේව වා''**

(Dwivedi. Agnipuranam, Chapter-49, Verse 2. Pdf 116. Book 102 )

(භූමිය දරා සිටින වරාහ අවතාරය මිනිස් සිරුරක් ඇතිව හෝ නැති ව, ගදාවක් සහ චක්‍රයක් දරා සිටින ආකාරයෙන් සෑදිය යුතු ය. දකුණු අතේ හෝ වම් අතේ ශංඛය තිබිය යුතු අතර ලක්ෂ්මී දේවිය හෝ නෙළුම් මලක් ද තිබිය හැකි ය.)

**හිරණ්‍යාක්ෂ**ගේ වැඩිමහලු නිවුන් සහෝදරයා වූයේ ''**හිරණ්‍යාක්ෂපු**'' නම් අසුරයාය. තම සහෝදරයා විෂ්ණු විසින් ඝාතනය කළ බව දැන ගත් ඔහු අසුරාචාරීන්ගේ උපදෙස් අනුව තපස් රැක මහා බ්‍රහ්මයාගේ අමරණීය වරයක් ලබා බලවත් විය. ඒ අමරණීය වරය නම්,

*''මහා බ්‍රහ්මයා විසින් මවන ලද දෙවියෙක්, මනුෂ්‍යයෙක්, මෘගයෙක් යන කිසිම ජීවියෙකු ගෙන් මරණය නොවේ වා! මාගේ මරණය දහවලේ දී හෝ රාත්‍රියේදී නොවේ වා! මාගේ මරණය නිවස ඇතුළත හෝ පිටත නොවේ වා! පොළොවේ හෝ අහසේ මාගේ මරණය නොමවේ වා! මිනිසෙකු හෝ දෙවියකු විසින් සාදන ලද කිසිම ආයුධයකින් මාගේ මරණය නොමවේ වා! ජීවි අජීවි ආයුධයකින් මාගේ මරණය නොමවේවා!''* (Kumar; A: 2025 Mahavatar Narsimha. Movei)

හිරණ්‍යාක්ෂපුගේ තපස ප්‍රබල බැවින් මහා බ්‍රහ්මයාට එම වර සියල්ල ලබාදීමට සිදුවිය. පසුව හෙතෙම සියලු දෙවියන් අසුරයන් යටපත් කොට නැගී සිටියේය. ඔහුගේ අමරණීය බලය හේතුවෙන් දෙවියන් භීතියට පත්වූ අතර ඔහු ඉදිරියේ පරාජය විය. මෙම තත්ත්වයක දී හෙතෙම පරාජය කිරීමට විෂ්ණු භාවිත කරන ලද ක්‍රම ඉතා ඥානාන්විත ය. නිර්මාණාත්මක ය.

*නරසිංහ යනු දෙවියකු, මිනිසෙකු, මෘගයෙකු නොව එම තිදෙනාගේ ම එකතුවකි. හිරණ්‍යාක්ෂපු මරණයට පත් කරන්නේ දහවලේදීත් රාත්‍රියේදීත් නොව සවස් කලයේ දී වන අතර නිවස ඇතුළත හෝ පිටත නොව දොර උළුවස්ස යට දී ය. උළුවස්ස එළියට හෝ ඇතුළට අයිති නැති සීමාවකි. තම දනහිස මත අසුරයා තබාගත්තේ එය අහසට හෝ පොළොවට අයත් නැති ශරීරයේ කොටසක් බැවිනි. තමාගේ නිය භාවිතයෙන් අසුරයාගේ බඩ මැදින් ඉරා දැමීමට හැකිවූයේ ඒවා දෙවියකු හෝ මිනිසකු විසින් සාදන ලද ආයුධයක් නොවන නිසා ය. නිය ශරීරයේ කොටසක් මිස ජීවි අජීවි ආයුධයක් ද නො වේ.* (Kumar; A: 2025 Mahavatar Narsimha. Movei)

මේ අනුව විෂ්ණු විසින් හිරණ්‍යාක්ෂපු අසුරයාට බ්‍රහ්මගෙන් ලැබුණු සියලු වරයන්ට සියයට සීයක් අනුකූල ව යමින් සතර වන ''**නරසිංහ**'' අවතාරය ධර්මය ස්ථාපිත කොට දෙව් මිනිසුන්ගේ භීතිය දුරුකරන ලදි. මුල් ම අවතාර අතර නරසිංහ අවතාරය විශේෂ වන්නේ ද මෙකී ඥානාන්විත, නිර්මාණාත්මක ස්වභාවය නිසාය. වර්තමානයේ ද හින්දූන් නරසිංහ අවතාරයක් ලෙස නොව නරසිංහ දෙවියන් ලෙස ඉතාමත් භක්තියෙන් වන්දනාමාන කරති.

**''නරසිංහො විවෘතාසෙ‍්‍යා වාමොරුධෘතදානවඃ**

**තද්වක්ෂො දාරයන් මාලී ස්ඵුරච්චක්‍රගාධරඃ''**

(Dwivedi. Agnipuranam, Chapter-49, Verse 4. Pdf 116. Book 102 )

(නරසිංහ විවෘත වූ මුඛයක් සහිත ව, වම්

කලවය මත දෛතවයා (හිරණ්‍යාක්ෂපුව) තබාගෙන, ඔහුගේ පපුව ඉරා දමමින් සිටිය යුතු ය. ඔහු මාලාවක් පැළඳ, බබළන චක්‍රයක් සහ ගදාවක් දරා සිටිය යුතු ය.)

දෙවියන් පරදවා ''**බලි**'' අසුරයා ලෝකයම යටපත් කර ගනිමින් පාලනය කරන ලදි. එහි දී මිටි බ්‍රාහ්මණයෙකුගේ ස්වභාවයෙන් පැමිණි පස්වන අවතාරය වූ ''**වාමන**'' විසින් පියවර තුනකින් මුළු ලොව ම ආවරණය කොට බලි අසුරයා පරාජය කරමින් දෙවියන්ට නැවත ලෝකයේ පාලනය ලබා දෙන ලදි. පොරවක් අතින් ගෙන ශක්ති සම්පන්න අයෝමය පුරුෂයෙක් සේ පැමිණි පස්වන අවතාරය ''**පරිශුරාම**'' වන අතර **භූගුපති** වශයෙන්ද හැඳින්වේ. ''**කර්තවීර්ය, අර්ජුන**'' වැනි දුෂ්ට ක්ෂත්‍රිය පාලකයන්ගෙන් පීඩාවට පත් ජනයා මුදවා ගෙන අධර්මය දුරුකොට ධාර්මිෂ්ඨ පාලනයක් ඇති කරන ලදි. (Dashavatara web) (Accessed: 6 October 2025) වාමන හා පර්ශුරාම පිළිබඳ ව මෙසේ විස්තර වේ.

**''ඡත්‍රී දණ්ඩී වාමනඃ ස්‍යාදථවා ස්‍යාච්චතුර්භුජඃ**

**රාමශ්චාපේෂුහස්තඃ ස්‍යාත් ඛඩ්ගී පරශුනාන්විතඃ''**

(Dwivedi. Agnipuranam, Chapter-49, Verse 5. Pdf 116. Book 102 )

(වාමන කුඩයක් හෝ දණ්ඩක් සහිත ව සිටිය යුතු ය, නැතහොත් අත් සතර සහිත ව සිටිය යුතු ය. පර්ශුරාම දුන්නක් සහ ඊතලයක් අතින් දරා සිටිය යුතු ය, නැතහොත් කඩුවක් හෝ පොරවක් සහිත ව සිටිය යුතු ය.)

හලදර, ගෝපාල, ''**කෘෂ්ණ**'' යන නම්වලින් හැඳින්වෙන්නේ අටවන අවතාරය යි. අග්නි පුරාණය හලදර ලෙස විස්තර කරනුයේ බලරාම වන අතර ක්‍රිෂ්ණ හා බලරාම සහොදරයන් වේ. ඇතම් අවස්ථාවල ක්‍රිෂ්ණ වෙනුයට බලරාම දශාවතාර අතරට යොදාගනී. හරිවංශයට අනුව කෘෂ්ණ මිනිසෙකි. එහෙත් ඔහු සාමන්‍ය මිනිසුන්ගෙන් වෙනස් වන්නේ විශේෂ අරමුණක් සඳහා ම දෙව්ලොව අතහැර පැමිණි බැවිනි. හෙතෙම ''**කංස, ශිශුපාල, දුර්යෝදන**'' වැනි අධර්මයෙන් යුතු කෲර අධර්මිෂ්ඨ පාලකයන් සමග සටන් කරමින් ඔවුන් පරාජය කර ලෝකයේ බර සැහැල්ලු කරන ලද්දේය. මහාභාරත යුද්ධයට අනුශාසනා කළ හෙතෙම ධර්මය ආරක්ෂා කිරීම ක්ෂත්‍රීය ධර්මයක් ලෙස විස්තර කරනු ලැබීය. භගවත්ගීතාව කෘෂ්ණ විසින් දේශනා කර ඇති අතර එය හින්දූන්ගේ පූජනීය ධර්ම ග්‍රන්ථය ද වෙයි. අන් කිසිදු ග්‍රන්ථයකට වඩා භගවත්ගීතාවට හින්දූන් ප්‍රිය වීමෙන් පෙනෙන්නේ සෙසු අවතාර පරයා කෘෂ්ණාවතාරය නැඟී ඇති බව යි.

තවද ඔහු විසින් ලෝකයට **කර්මයෝග, ඥානයෝග, භක්තියෝග** යන ප්‍රධාන යෝග ත්‍රිත්වය ද හඳුන්වා දෙන ලදි. වරෙක ගැඹුරින් ධර්ම කරුණු පවසන මුනිවරයෙක් වූ කෘෂ්ණ වරෙක සාධාරණත්වය උදෙසා සටන් කිරීමට මිනිසුන් යුද බිමට කැඳවන රණශූරයෙකි (රණසිංහ; 2016: 22). ඒ බව භගවත් ගීතාව අධ්‍යනයෙන් මනාව විශද වෙයි.

ධාර්මිෂ්ඨ ජීවිතයක අර්ථාන්විත භාවය පෙන්වමින් පහළ වූ හත්වන අවතාරය ''**රාම**'' ය. අයෝද්‍යාවේ රාජකීය කුමාරයා වූ ඔහු ඒ සියල්ල අතහැර වනගත වන අතර හෙළයේ ''**රාවණ**'' නම් යක්ඛ සේනාධිපතියා පරාජය කරයි. රාමායනයට අනුව රාවණ යනු බුද්ධිමත්, රණශූර, ත්‍යාග ශීලි, තවුස්දම් රකින, ස්වභාදහමට ළැදි, ප්‍රේමණීය පෞරුෂයකින් හෙබි චරිතයකි. එවන් පුද්ගලයෙක් පරාජය කිරීමට තරම් රාම දක්ෂ වී ඇති බව රාමායනයේ විස්තර කරනු ලැබේ. රාම චරිතයෙන් මනුෂ්‍යත්වයේ විශිෂ්ටත්වය ප්‍රකාශ කෙරෙන

අතර වෛෂ්ණව භක්තිකයන්ගේ ප්‍රබල ම වීරයා ද වේ. (රණසිංහ; 2016: 28)

**''රාමශ්චාපි ශරි ඛඞ්ගී ශඞ්ඛී වා ද්විභුජඃ ස්මෘතඃ**

**ගදාලාඞ්ගලධාරී ච රාමෝ වාථ චතුර්භුජඃ''**

(Dwivedi. Agnipuranam, Chapter-49, Verse 6. Pdf 116. Book 102)

(රාම දුන්නක්, ඊතලයක්, කඩුවක් හෝ ශංඛයක් සහිතව දෙ අතක් ඇතිව සිටිනු ඇත. රාම (බලරාම) යගදාවක් හෝ නගුලක් ද දරා සිටිය හැකි ය.)

දස අවතාර අතර අවිහිංසාවාදී මෛත්‍රියෙන් යුතු කරුණාවන්ත ම අවස්ථාව බුද්ධාවතාරය වේ. අන් සියලු දෙනා විනාශය, ලේ වැගිරීම්, ඝාතන සිදු කරන නමුත් බුද්ධාවතාරය එසේ නොවේ. මෛත්‍රියෙන් සියල්ල ජය ගන්නා අතර ඇතැම් පුරාණයක අසුරයන් නොමඟ යවන්නා ලෙස ද දැක්වේ. සටකපට වූ අසුරයන් වේදය හදාරා යාග හා යාඥා මඟින් අධික බලයක් ලබාගෙන ලෝකයට හා ලෝක ධර්මයට තර්ජනයන් සිදු කරනු ලැබීය. ඒ හේතුවෙන් විෂ්ණු බුද්ධ ස්වරූපයෙන් පහළ වී අසුරයන් වේදයෙන් ඉවත් කිරීමට අවිහිංසාව නාස්තිකවාදී සංකල්පය දේශනා කරන ලදි. එය අසුර බලය හීන කිරීමට ගත් උපක්‍රමයක් ලෙස වෛෂ්ණවයෝ විස්තර කරති. ඒ බව ගරුඬ පුරාණය මෙසේ විස්තර කරයි.

**''තත්තඃ කලෙස්තු සන්ධ්‍යාන්තෙ සම්මොහාය සුරද්විෂාම්**

**බුද්ධො නාම්නා ජිනසුතඃ කීකටේෂු භවිෂ්‍යති''**

(Pandey, P. S. R. ; Garudapuraaa; 1.32 : Pdf 30. Book 2)

(ඉන් අනතුරුව, කලියුගයේ සන්ධ්‍යාංශය අවසන් වන විට, දෙවිවරුන්ට ද්වේශ කරන්නවුන් මුළා කිරීම පිණිස, බුද්ධ නමින්, අතිජාත පුත්‍රයා කීකට දේශයේ පහළ වනු ඇත.)

බුදුන් වහන්සේ අවතාරයක් හෝ දෙවියකු වශයෙන් බෞද්ධ දර්ශනය තුළ පිළිනොගනිති. ප්‍රඥාවෙන් හා බුද්ධිමය වශයෙන් පරිපූර්ණත්වයට පත් වූ උත්තරීතර මනුෂ්‍යයෙක් වශයෙන් පිළිගනිති. මේ පිළිබඳ ව ඉදිරියේ දී සාකච්ඡා කෙරෙන බැවින් වැඩි තොරතුරු ඉදිරියේ දී හඳුනා ගත හැකි ය. ඇතැම් පුරාණයක බුද්ධ වෙනුවට බලරාම නාමය අතුළත් වුව ද පශ්චාත්කාලීන ව දශාවතාර අතුරෙන් බලරාම ඉවත් වී ඇත. බුද්ධාවතාරයේ ස්වභාවය පිළිබඳව අග්නි පුරාණය මෙසේ අනාවරණය කෙරෙනු ලැබේ.

''ශාන්තාත්මා ලම්බකර්ණශ්ච ගෞරාඞ්ගශ්චාම්බරාවෘතඃ

ඌර්ධ්වපද්මස්ථිතෝ බුද්ධෝ වරදාභයදායකඃ''

(Dwivedi. Agnipuranam, Chapter-49, Verse 8. Pdf 116. Book 102)

(බුදුන් වහන්සේ ශාන්ත ස්වභාවයකින් යුතු, දිගු වූ කන්පෙති සහිතව, රන්වන් ශරීර වර්ණයක් සහිත ව, වස්ත්‍රයකින් ආවරණය වී, පියුමක් මත හිඳගෙන, වරද හෝ අභය මුද්‍රාවෙන් යුතු ඉරියව්වෙන් සිටිය යුතු ය.)

දස වැන්න කල්කී අවතාරයයි. ඔහු පහළ වන්නේ වර්තමාන කලියුගයේ අවසානයේ දී ය. එම යුගයේ ආධිපත්‍යය දරණ **අසත්‍යය, අයුක්තිය, පිරිහීම** වැනි සියලු දුර්ගුණ සමඟ සටන් කිරීම, අධර්මිෂ්ඨ දුෂ්ට පාලකයන් සහ සොර සතුරන් පරාජය කොට නව යුගයක් බිහි කිරීම ඔහුගේ කර්තව්‍ය වේ. එය සත්‍යය යුගය ලෙස හඳුන්වන අතර නැවත ධර්මය ස්ථාපිත කිරීමකි. හෙතෙම සුදු අශ්වයකු පිට නැගී, ගිනිගත් අසිපතක් අතින් දරා මෙලොවට

පැමිණෙන බව දැක්වේ. (Dashavatara web) (Accessed: 6 October 2025)

**''ධනුස්තෘණාන්විතඃ කල්කී ම්ලෙච්ඡොත්සදකයෝ ද්විජඃ**

**අථවාශ්වත්ථස්ථිතඃ ඛඩ්ගී ශඞ්ඛචක්‍රශරාන්විතඃ''**

(Dwivedi. Agnipuranam, Chapter-49, Verse 9. Pdf 116. Book 102)

(කල්කි අවතාරය දුන්නක් සහ ඊතල සමූහයක් සහිත ව, බ්‍රාහ්මණ වෙසින් ම්ලේච්ඡයන් විනාශ කරන්නෙකු මෙන් සිටිය යුතු ය. නැතහොත් අශ්වයකු පිට වාඩි වී, කඩුව, ශංඛය, චක්‍රය, ඊතලය ආදිය දරා සිටිය යුතු ය.)

බුද්ධ දක්වා අවතාර නවයක් අවතරණය වී ඇති අතර කල්කී පහළවීමට නියමිත ය. මේ ආකාරයෙන් දස අවතාර පිළිබඳ ව සංක්ෂිප්ත අවබෝධයක් ලබා ගත හැකි අතර අවතාර සංකල්පයේ විකාශය ක්‍රමික ව පෙළගස්වා ඇත. ඉහත දැක්වූ ආගමික සංකල්පයෙන් වෙනස් වූ විද්‍යාත්මක පසුබිමක් ද මෙහි ගම්‍ය වේ. ඒ නම් ජීව පරිණාමීය සංකල්පය යි. බටහිර විද්‍යාවේ දැක්වෙන ජීව පරිණාමීය සංකල්පය ලෝකයේ ප්‍රචලිත වුවත් ඊට වසර දහස් ගණනකට පෙර මෙම සංකල්පය ඉදිරිපත් වී ඇති බව හඳුනාගත හැකි ය. එකී විද්‍යාත්මක සංකල්පය විමසා බැලීම බුද්ධාවතාර සංකල්පය විස්තර කිරීම සඳහා අතිශය වැදගත් වේ.

**අවතාර සංකල්පයේ ජීව පරිණාමීය ලක්ෂණ**

භක්තිපූර්වක ආගමික සංකල්පය මත ගොඩනැගුණු දශාවතාර සංකල්පය පිළිබඳව ඉහත දක්වා ඇති අදහස්වලින් අනතුරුව මෙහි ඇති විද්‍යාත්මක සංකල්පයක් පිළිබඳ ව අනාවරණය කර ගත හැකි ය. දශාවතාර පෙළ ගැස්ම වර්තමානයේ විද්‍යාත්මක ව දක්වන ජීව පරිණාම සංකල්පයට සමාන ය. අවතාර පහළ වූ කාලය හා විද්‍යාත්මක ව දක්වන කාලවල කිසිදු සමාන කමක් නැතිබව දැක්විය යුතු ය. එහෙත් එම චරිත තුළ අන්තර්ගත ස්භාවය විද්‍යාත්මක සංකල්පයන්ට බෙහෙවින් සමාන ය. ආගමික සංකල්පයක් සමග විද්‍යාත්මක සංකල්පයක් සංසන්දනය කිරීමට ගන්නා මෙම උත්සාහය පර්යේෂණයේ ප්‍රධාන මාතෘකාව සංවර්ධනය කර ගැනීමට පිටුවහලක් ලබා දෙනු ඇත. දශාවතාර පෙළගැස්මේ දී රාම, කෘෂ්ණ වශයෙන් ඇතත් මෙම සංකල්පයේ දී කෘෂ්ණ, රාම වශයෙන් ස්ථාන මාරුවන බව ද දැක්විය යුතු ය.

අප්‍රමාණ වූ සත්ත්ව විෂය හා එහි ආරම්භය, අවසානය පිළිබඳව ආගමික හා විද්‍යාත්මක යන දෙයාකාරයෙන්ම තොරතුරු අනාවරණය වෙත් එවායෙහි සත්‍ය අසත්‍ය භාවය නිශ්චය කිරීමට අපහසු ය. වර්තමාන විද්‍යාවෙන් බොහෝ ආගමික සංකල්ප බැහැර කරන අතර ඇතැම් තැනක දී ඒවා විද්‍යාත්මකව තහවුරු කොට ගෙන ද ඇත. තහවුරු කළ තොරතුරුවලට වඩා එසේ නොකළ ආගමික සංකල්ප බොහෝ ය.

1927 දී විශ්වය බිහිවීම පිළිබඳ 'මහා පිපුරුම් වාදය' (Big bang theory) ඉදිරිපත් කරන ලද්දේ කතෝලික පූජකවරයෙක් සහ තාරකා විද්‍යාඥයෙකු වූ **ජෝර්ජස් ලෙමැයිත්‍රි** (Georges Lemaitre) නම් බෙල්ජියම් ජාතිකයා ය. ඔහුට අනුව වසර මිලියන 18000 පමණ පෙර ඇති වූ මහා පිපුරුමකින් පැතිරුණු දූවිලි අංශු කැටි ගැසීමෙන් විවිධ විපර්යාසයන්ට ලක් වෙමින් වසර මිලියන 4600 - 5000 ට පමණ පෙර පෘථිවිය ඇතුළු සෞරග්‍රහ මණ්ඩලය නිර්මාණය විය.

ජීව විද්‍යාඥයන්ගේ පුරාවිද්‍යාඥයන්ගේ හා ඉතිහාසඥයන්ගේ නිර්ණායකයන්ට හා පර්යේෂණයන්ට අනුව එකී මහා පිපුරුමෙන් ලෝකයේ බිහි වී නොයෙක් විපර්යාසයන්ට ලක්වෙමින් නොයෙක් යුග පහු කරමින්

වර්තමාන ජීවය දක්වා පරිණාමය වී ඇත. පෘථිවිය නිර්මාණ වීමෙන් පසු ජීවයක් ඇරඹීමට සුදුසු පරිසරයක් ඇතිවීම හා ජීවය සම්භවය වීම පිළිබඳ විද්වත් අදහස් කිහිපයක් දැක්විය හැකි ය.

**තාලස්** - **(ක්‍රි.ව. 624 - 548)** ජලජ (කරදිය) පරිසරය මත ජීවීන්ගේ සම්භවය සිදුවී ඇතැයි යන්න මොහු දක්වන සිද්ධාන්තය යි. එසේ ම සාගර ජලය සියලු සත්ත්වයන්ගේ මාතෘත්වය ලෙසද විග්‍රහ කෙරේ. (පාලිත හිමි, 2015: 94)

**ඇලෙක්සැන්ඩර්** - **(ක්‍රි.ව. 611 - 547)** සියලු ම ජීවීන් මූලික තරලයකින් (primordial fluid) පරිණාමය වී ඇති බව ප්‍රකාශ කරන මොහු පෙර ජලයේ ඇතිවූ මත්ස්‍යයෙක් වැනි ජීවියෙක්ගෙන් මිනිසා ද පැවත එතැයි දක්වති. පසුව භෞමික පරිසරයට අනුවර්තනය වී ජීවත්වීම ආරම්භ කර ඇති බව ද ප්‍රකාශ කෙරේ (පාලිත හිමි, 2015: 94).

**ක්සෙනෝෆනීස්** - **(ක්‍රි.ව. 570 - 480)** පොසිල යනු අතීත ජීවීන්ගේ අවශේෂ බව මුලින් ම දක්වන ලද්දේ මොහුය. වියලි පරිසරයේ හමුවන කරදිය වාසී ජීවීන්ගේ පොසිල මගින් අතීතයේදී එම භූමිය කරදිය පරිසරයට අයත්ව තිබූ බව ද හෙතෙම දක්වයි. පෘථිවිය සම්පූර්ණයෙන්ම ජලයෙන් යට වී තිබූ බවත් එහි ජීවය ඇතිවූ බවත් හෙතෙම දක්වයි (පාලිත හිමි, 2015: 94).

මෙම තොරතුරු මත පෙනීයන ප්‍රධාන කාරණයක් නම් ක්‍රමයෙන් පරිණාමය වූ පෘථිවිය සම්පූර්ණ ජලජ පරිසරයකට අයත්ව තිබූ බවයි. එසේම ජීවය ජලය මූලික කොට ගනිමින් බිහිවී ඇති ආකාරයයි. පරිසරය කෙමෙන් වෙනස් වෙමින් ජලය අඩුවෙමින් ගොඩබිම් නිර්මාණය වීම සිදුවී ඇති බව යි. ජීවයේ පරිණාමය පිළිබඳ ව අදහස් දක්වන විද්‍යාඥයන් ප්‍රකාශ කරන්නේ එකී ගොඩබිමට ජලජ ජීවීන් අනුවර්තනය වී ඇති බව යි. තව ද මෙම පරිණාමීය සංකල්පය මත ජලජ ජීවී, උභය ජීවී, උරග, ක්ෂීරපායි වශයෙන් ම වර්ගවලට බෙදා දැක්වේ. ජලජ ජීවීන්ගේ සිට වර්තමාන මිනිසා දක්වා වූ විද්‍යාත්මක විග්‍රහයට සමාන විග්‍රහයක් ආගමික පරිසරයක ගොඩනැගුණු විෂ්ණු දාශාවතාර සංකල්පය තුළ විද්‍යාමාන වීම විමතියට කරුණකි.

එම සංකල්පය විග්‍රහයට පෙර පරිණාමවාදයේ පියා වශයෙන් සැලකෙන චාල්ස් ඩාවින්ගේ (Charles Darwin) න්‍යාය කෙටියෙන් අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. 1959 දී චාල්ස් ඩාවින් විසින් ''**ජීව විශේෂයන්හි සම්භවය**'' (On the origin of species) නමැති කෘතියෙන් **පරිණාමවාදී සංකල්පය** (Theory of Evolution) ඉදිරිපත් කරන ලදි. ජීව විද්‍යාවේ පදනම වශයෙන් අදටත් පිළිගැනෙන්නේ මේ න්‍යායන් ය. ජීවීන් කාලය සමඟ සංකීර්ණ වී විවිධ ආකාරයට පරිණාමය වන ආකාරය මෙයින් විග්‍රහ කරනු ලැබේ. ඩාවින්ගේ න්‍යායේ හරය වන්නේ **ස්වභාවික වාරණය** (Natural Selection) නමැති යාන්ත්‍රණය යි. එය පහත න්‍යායන් මත පදනම් වෙති.

**අධික ප්‍රජනනය** - (Overpraduction) සෑම ජීවී විශේෂයක් ම පරිසරයට ජීවත් කරවිය හැකි ප්‍රමාණයට වඩා ජීවීන් ප්‍රමාණයක් බිහිකරති. එහි දී දිවි රැක ගැනීමට හැකි ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් බිහිවේ.

**පැවැත්ම සඳහා අරගලය** - (Struggle for Existence) අධික ලෙස ජීවීන් බිහිවීම හේතුවෙන් වාසස්ථාන, ආහාර, ජලය, සහකරු වැනි සම්පත් සඳහා දැඩි තරගයක් ඇති වේ. මෙයින් ඇතැම් ජීවීන්ට දිවිරැක ගැනීමට අපහසුවේ.

**විචලනය** - (Variation) ජීවී විශේෂයන්හි කායික ලක්ෂණ හා හැසිරීම්වල විවිධත්වයක් පැවතීම මෙයින් විස්තර වන අතර මෙම විචලන තත්ත්වය ජානමය වශයෙන් පසු පරම්පරාවට හිමි වේ. එය පරිණාමය වීමට බලපාන ප්‍රධාන සාධකයක් ද වේ.

**ස්වභාවික වාරණය** - (Natural Selection) පරිසරයේ වෙනස් වීම් හමුවේ විචලනයන් සහිත ජීවීන් අතරෙන් වඩාත් හොඳින් එම තත්ත්වයට අනුවර්ථනය වන ජීවීන් පමණක් ඉතිරිවී, සාර්ථක ව ප්‍රජනනය කර තම ලක්ෂණ ඉදිරි පරම්පරාව සඳහා ලබා දේ. පරිසරයට අනුවර්තනය නොවන ජීවීන් ක්‍රමයෙන් වඳවීමට ලක්වේ. මෙය ස්වභාවික තෝරාගැනීමක් වශයෙන් විස්තර කළ හැකි ය.

**නව විශේෂ බිහිවීම** - (Origin of new Speaies) කාලයෙන් කාලයට සිදුවන මෙම කුඩා කුඩා වෙනස්කම් හේතුවෙන් හා ස්වභාවික වාරණ හේතුවෙන් මුල් ජීවීන් වෙනස් වී නව ජීවී විශේෂ බිහිවේ. වෙනස්කම් සහිත ව පැවත ඒම (Descent with Modification) වශයෙන් ඩාවින් මෙය හැඳින්වීය.

ඩාවින් මෙම වටිනා න්‍යාය ඉදිරිපත් කරන්නේ H.M.S Beagle නෞකාවෙන් ලොව වටා ගමන් කරමින් (1831 - 1836) සිදු කළ ස්වභාව විද්‍යාත්මක පර්යේෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් ය. විශේෂයෙන් ම ගලපගොස් දූපත්වල (Galapagos Islands) ෆිංචි (Finches) නමැති කුරුල්ලන් පිළිබඳව කළ අධ්‍යයනය මෙම පරිණාමවාදී සංකල්ප ඉදිරිපත් කිරීමට ප්‍රධාන වශයෙන් සාධක වී ඇත. හෙතෙම ''**ජීව විශේෂයන්හි සම්භවය**'' (On the origin of species) නැමැති කෘතිය 1859 දී ඉදිරිපත් කිරීමෙන් වර්තමානයේ පරිණාමවාදයේ පියා වශයෙන් ද නම් ලබා සිටී.

වර්තමාන ලෝකය පිළිගත් ඩාවින්ගේ මතය ඉදිරිපත් වීමට අවුරුදු දහස් ගණනකට පෙර භාරත ආගමික පරිසරයෙන් ද ආගමික මුහුණුවරකින් මෙම පරිණාමවාදය සංකල්පය ඉදිරිපත් වී ඇත. එයට කදිම උදාහරණයක් වශයෙන් දශාවතාර සංකල්පය පෙන්වාදිය හැකි ය. පෘථිවිය නිර්මාණය වී කාලයකට පසු මුළු ලෝකය ම කරදියෙන් පිරීගොස් ඇත. මෙලොව නිර්මාණයේදී ඇති වූ ජලගැල්මක් පිළිබඳ ව බොහෝ ආගම් හා සංස්කෘතීන් තුළ දක්වනු ලබති. ඒ අතර කිහිපයක් ලෙස **කතෝලිකයන්ගේ බයිබලයේ, පැරණි ගිවිසුම් උප්පත්ති ග්‍රන්ථයෙහි ''නෝවාගේ නැව''** කතාව ද, **ඉස්ලාම් අල්-කුරාණයේ අල්ලාගේ පණිවිඩය ප්‍රතික්ෂේප කිරීමට ලැබුණු දඬුවම ද, මෙසපොතේමියානු ගිල්මේශ් වීරකාව්‍යයේ, උට්නාෆිෂ්ටිම් කතාව** ද, **ග්‍රීක පුරාවෘත්ත** ද, **සොරොඇස්ට්‍රියානු ආගම** ද දැක්විය හැකි ය. එසේ ම ප්‍රධාන මාතෘකාවට සම්බන්ධ **වෛෂ්ණව හා හින්දු ආගම්** තුළ ද එය විස්තර වේ. ඉහත දැක්වූ ආගමික හා විද්‍යාත්මක තොරතුරු අධ්‍යයනයෙන් පසු දස අවතාර සංකල්පයේ ඇති පරිණාමවාදී ලක්ෂණ පහත පරිදි වඩාත් හොඳින් පැහැදිලි කර ගත හැකි ය.

**මත්ස්‍ය** - පළමු අවතාරය වූ මත්ස්‍ය ජලගැල්මෙන් මනු, වේදය හා සප්ත ඍෂිවරුන් බේරාගැනීම ජීවී පරිණාමයේ මූලික අවස්ථාවට සමාන කම් දක්වයි. මත්ස්‍යයා යනු ජලජ ජීවියකි. ජීවී පරිණාමයේ මුල් අවස්ථාව දැක්වීමේ දී විස්තර වන ජලජ ජීවියා මත්ස්‍යයෙක් යන සිද්ධාන්තය විද්‍යාඥයන් පිළිගෙන ඇත. ප්‍රථම පෘෂ්ඨ වංශිකයා සේ සැලකෙන මෙම මත්ස්‍යයන් වසර මිලියන 540ක් පමණ පැරණි බව ජීව විද්‍යාඥයන්ගේ මතය යි. එම ජීවීන් කේම්බ්‍රිය කාල පරිච්ඡේදයේ (Cambrian Period) පැලියෝසෝයික් යුගයේ (Paleozoic Era) මුල් අවස්ථාවට අයිති කොඳු නාරටියක් සහිත මුල් ම ජීවීන් ලෙස හැඳින්වේ. අවතාර අතර මුල්ම අවතාරය මත්ස්‍ය වේ. එම සංකල්ප දෙක ආගමික හා විද්‍යාත්මක වශයෙන් සමාන කමක් දක්වන බව මේ පිළිබඳව පර්යේෂණ කළ විද්වතුන්ගේ මතය යි (පාලිත හිමි, 2015: 96).

**කූර්ම** - කූර්ම හෙවත් කැස්බෑවා යනු ගොඩබිම හා ජලයේ වාසය කරන උභය

ජීවියකි. විෂ්ණු කූර්ම වේශයෙන් පැමිණීම සංකේතවත් කරනු ලබන්නේ ජීව විද්‍යාත්මක මතය අනුව කෙමෙන් ජලය අඩුවී ගොඩබිම් ඇතිවීමේ අවස්ථාවට ය. ජලජ ජීවීන් ගොඩබිම් සෑදෙන අවස්ථාවේ එයට අනුවර්තනය වෙමින් ජලය හා ගොඩබිම අතර ජීවත්වීමට පුරුදු විය. ඩාවින්ගේ මතයට අනුව විචලන තත්ත්වයන්වලට හොඳින් අනිවර්තනය වූ ජීවීන් වශයෙන් මෙම විශේෂය හැඳින්විය හැකි ය. අවතාර සංකල්පයෙන් එකී පරිණාමීය අවස්ථාව කූර්ම අවතාරවලින් දක්වන බව ප්‍රකාශ කළ හැකි ය. මේ අවස්ථාව වසර මිලියන 500 කට පෙර ඩෙවෝනියන් කාල පරිච්ඡේදයට (Devonian Period) අයත් පැලියෝසෝයික් යුගයේ (Paleozoic Era) අවසන් කාලය ලෙස හැඳින්වේ. මත්ස්‍යයාගේ ක්‍රමානුකූ වෙනස්වීම් හා උගේ වරල් පාද බවට පත්වීම කසේරුකා සවිමත් වීම මෙකල සිදු වී ඇති අතර එකී භෞමික වාසි පෘෂ්ඨ වංශිකයන්ට කූර්ම අතිශයින් සමාන ය.

**වරාහ** - ජලයට හා ගොඩබිමට අනුවර්තනය වූ සත්වයාට පසුව ගොඩබිම් හා මඩබිම්වල ජීවත්වීමට හැකියාව ලැබිණි. එම අවස්ථාව වරාහගෙන් පෙනේ. වරාහ යනු ගොඩබිම් සහ මඩබිම්වල වාසය කරන ජීවියෙකි. ජීව පුරාවිද්‍යාඥයන්ගේ පර්යේෂණයන්ට අනුව ජලජ හා උභය ජීවීන්ගෙන් පසුව ට්‍රයිසික් අවධියේ (Triassic Periad) මැසෝසොයික් යුගයේ (Mesozoic Era) උභය ජීවීන් ජලාභුජ සත්ත්වයන් වශයෙන් බිහි වී කුඩා කල කිරිවලින් පෝෂණය විය. මෙයින් උභය ජීවී අවස්ථාවේ වර්ධනීය තත්වයක් පෙන්නුම් කරණු ලැබේ. වසර මිලියන 250 ට පමණ පෙර මැසෝසොයික් යුගයේ ගොඩබිම් මහද්වීපාදී බවට පත්වීමේ දී ජලය වියලී මඩවගුරු ඉතිරි වු අතර එයට අනුවර්තනය වීමට නොහැකි බොහෝ ජීවීන් විනාශ විය. එකී ස්වභාවයට අනුවර්තනය වූ ජීවීන් රාත්‍රී කාලයේ සැරිසරන ස්වභාවයකින් ද යුතු විය. මුහුදු ජීවීන්ගේ පොසිල ගොඩබිම් ආශ්‍රිත ප්‍රදේශවලින් හමුවීම මෙම සංකල්පය විද්‍යාත්මකව සනාථ කිරීමකි. මෙම යුගයේ කිරි බී වැඩීම. මඩ වගුරුවල හා ගොඩබිම්වල ජීවත්වීම. රාත්‍රියේ සැරි සැරීම ආදි සියලු සාධකවලට වරහ අවතාරයේ සමාන කම් ඇත. මෙයින් ආගමික සංකල්පයේ තිබෙන විද්‍යාත්මක ලක්ෂණ හොඳින් අවබෝධ වේ.

**නරසිංහ** - සිංහයෙකුගේ හා මිනිසකුගේ ස්වභාවයෙන් යුත් මෙම අවතාරයේ ඇති විශේෂත්වය නම් මිනිස් ස්වභාවය දැරීම යි. වසර මිලියන 23 කට පමණ පෙර මයෝසීන කාල පරිච්ඡේදය (Miocene Periad) මෙයින් විස්තර වේ. ක්ෂීරපායින්ගේ යුගය (Age of mammals) ලෙස හැඳින්වෙන මේ කාලයේ තණ බිම්වල ව්‍යාප්තිය සිදු විය. වර්තමානයේ සිටින බොහෝ ක්ෂීරපායින්ගේ මුල් ම සාමාජිකයන් මේ යුගයේ වාසය කළ බව සඳහන් කළ හැකි ය. ඒ අතර මිනිස් ප්‍රජාවේ පූර්වතමයාගේ පරිණාමය ද මේ සමයේ සිදු විය. එනම් ප්‍රොකොන්සල් (proconsul) නම් මානවයන්ට සමාන වානර පරිණාමය යි. වර්තමාන මානවයාගේ හා වානරයාගේ ආදිතමයා ප්‍රොකොන්සල් වානරයා වේ. නරසිංහගෙන් ආගමික මුහුණුවරකින් දක්වන්නේ එකී සත්වයාගෙන් මිනිසා පරිණාමය වන අවස්ථාව බව ප්‍රකාශ කළ හැකි ය (පාලිත හිමි; 2015: 96).

**වාමන** - දස අවතාර තුළ දැක්වෙන පරිණාමයේ තවත් අවස්ථාවක් වශයෙන් වාමන දැක්විය හැකි ය. එනම් මානව ස්වරූපය මූලික ව ම ආරම්භ වූ අවස්ථාව යි. මිනිස් - ඒප් (Man ape) නම් සුවිශේෂී සත්ව වර්ගය මීට වසර මිලියන 02ට පමණ පෙර අප්‍රිකා මහද්වීපයේ ජීවත්වූ බවට හමුවී ඇති පොසිල සාධක සාක්ෂී සපයයි. ප්ලයිඕසීන (Pliocene) යුගයට හෙවත් අයිස් යුගයට (Ica - age) අයත් **හෝමෝ ඉරෙක්ටස්** (Homo Erectus) නමින් හැඳින්වෙන මෙම ජීවියා අඩි හතරක් පමණ උසින් යුතු ය. මොවුන්ට කෙලින් සිටගෙන දිවිය හැකි අතර අත් නිදහසේ භාවිත කිරීමට

ද හැකි විය. ගින්දර මුල්වරට භාවිත කළ මොවුන් සංචාරක ජීවිතයක් ගත කළේය. ඔවුන්ගේ කශේරුකාව නූතන මිනිසාට තරමක් සමානය (පාලිත හිමි; 2015: 97). නරසිංහගේ තිබූ වනචාරී ස්වභාවය ඉවත් වූ මානව ස්වරූපය වාමනගෙන් විස්තර වන අතර මිටි ස්වභාවයෙන් ද යුක්තය. පියවර තුනකින් ලෝකය පුරා ගමන් කිරීමෙන් සංචාරක ස්භාවය ඉස්මතු වේ. එම තොරතුරු අනුව ඉහත පරිණාමී අවස්ථාව පැහැදිලි වශයෙන්ම විස්තර වේ.

**පරශුරාම** - ක්‍රමානුකූලව ජලජ සත්ත්වයාගේ සිට පරිණාමය වූ මානවයා විශාල කාල පරාසයක් තුළ කාලගුණික, දේශගුණික විපර්යාසයන්ට ලක් වෙමින් ඒ ඒ යුගවලට අනුවර්තනය වෙමින් පැමිණ දියුණු තත්ත්වයකට පත් විය. පර්ශුරාම ලෙස දැක්වෙන්නේ විෂ්ණුගේ එක් යුගයක පහළ වීම යි. පොරවක් අතින් ගත් ශක්තිමත් මිනිසෙකු එයින් නිරූපණය වේ. පර්ශුරාමට සමාන මානව කොටසක් මීට වසර ලක්ෂ 04කට පමණ පෙර කාලයේ ජීවත් වූ බවට සාධක ඇත. **හෝමෝ නියෙන්ඩතාල්** මානවයා (Homo Neanderthal) වශයෙන් හඳුන්වන ඔවුන් ශාක මෙන්ම මාංශ ද ආහාරයට ගෙන ඇත. "**මුස්ටේරියන්**" (Mousterian) නම් තියුණු දාර සහිත මෙවලම් ද ඔවුන් ආයුධ වශයෙන් භාවිතා කොට ඇත. ප්ලයිස්ටෝසීන යුගය (Pietocene Era) වශයෙන් හැඳින්වෙන කාලයේ දී වානරයාගෙන් මිදුන දක්ෂ හා බුද්ධිමත් මිනිස් ස්වභාවයක් පෙන්වා ඇත. එසේම නූතක මානවයාගේ පූර්ව අවධිය වේ. පෙර සිටි මානවයන්ට වඩා මොළයේ ප්‍රමාණය විශාල වන අතර ශරීර ශක්තිය ඉතා විශාල විය. මළවුන් භූමදානය කිරීම මුලින් ම සිදු කොට ඇත්තේ මොවුන් ය.

අවතාර අතර මුලින් ම ආයුධයක් භාවිත කරනු ලබන්නේ ද පර්ශුරාමය. සත්ත්ව ස්භාවය ඉක්මවා ගොස් නියම මානව ස්භාවය මෙයින් දැක්වෙන අතර තවත් විද්‍යාත්මක තොරතුරු මේ පර්ශුරාමගෙන් විද්‍යාමාන වේ.

**කෘෂ්ණ** - හලරාම හෙවත් කෘෂ්ණ වශයෙන් හඳුන්වන්නේ ද අවතාරයකි. 'හල' යන වචනයෙන් නගුල විස්තරවන අතර නඟුලක් අත ඇති ව සිටින මිනිසෙක් දස අවතාර අතර නිරූපණය වේ. නඟුල කෘෂිකර්මාන්තයට යොදාගන්නා අතර එයින් ඒ සමයේ ජීවන රටාව පෙන්නුම් කරති. නඟුල දරා සිටින්නා ඇතැම් තැනක බලරාම වශයෙන් විස්තර වේ. 'ගෝපාල' නමින් හැඳින්වෙන කෘෂ්ණ බට නලාවක් අතින් දරා සිටිම ද විශේෂ වේ. මෙම දෙදෙනාම සමකාලීන සහොදරයන් බැවින් මේ දෙදෙනාගෙන් සංකල්ප කිහිපයක් ගම්‍ය වන බව පෙනේ. ඒ අනුව **සත්ත්ව පාලනය, කෘෂිකර්මාන්තය, සංගීතය** ආදිය අතිශය ප්‍රවර්ධනය වූ කාලය හා සමාජය මෙයින් විස්තර වේ.

පුරාවිද්‍යාත්මක හා ජීව විද්‍යාත්මක සාධක අනුව පරිණාමීය අවස්ථාවේ ගල් යුගයෙන් පසු මානවයා එළඹෙන්නේ කෘෂිකාර්මික යුගයටය වසර 40000 ට පමණ පෙර ක්‍රෝ - මැග්නන් (Cro – magnon) නම් මානව විශේෂයක් අප්‍රිකාවේ සිට යුරෝපය දක්වා ව්‍යාප්ත වී ඇත. නූතන මානවයන් හෙවත් හෝමෝ සේපියන්ස් (Homo Sapiens) ලෙස ද මොවුන් හැඳින්වේ. මූලික ව ම දඩයමෙන් ජීවත් වූ මොවුන් සංචාරක දිවිය නවතා ගෘහස්ථකරණය වී ඒ අවට ආහාර නිෂ්පාදනය කර ගත්තේය. සතුන් හීලෑ කර ගනිමින් ඔවුන් පාලනය කිරීම ද සිදුකරන ලදි. මෙම සතුන් පාලනය කිරීමට විවිධ ශබ්දාදිය භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි ය. ඒ බවට ක්‍රිෂ්ණ අත වූ වස්දණ්ඩ සාධයක් ලෙස දැක්විය හැකිය. මෙම මානවයින් මුල්ම නූතන මානවයින් (Early Modern Humans) වශයෙන් ද හැඳින්වේ.

භක්තිමත් භාවයෙන් හින්දුන් වර්ණිත කෘෂ්ණාවතාරයෙන් ආගමික සංකල්පයට

අමතරව වනචාරී දිවියෙන් සමුගත් මානවයා හා සංචරණ දිවිය නවතා විවාහ ආදිය සිදුකරමින් කෘෂිකර්මාන්තය තුළින් සශ්‍රීක වූ මානවයා ද දැක්වේ. පරිණාමීය ලක්ෂණ කෘෂ්ණගෙන් පෙන්වාදිය හැක්කේ නූතන විද්‍යාත්මක හෝමෝ සේපියන්ස් සංකල්පයට එහි ඇති සමාන කම නිසා ය.

රාම-ශිෂ්ටසම්පන්න පරිණාමීය සමාජයකට උරුමකම් කියන රාම තුළින් බුද්ධියේ පරිණාමීය අවස්ථාවන් හා සදාචාර සම්පන්න මානවයා දැක්වේ. හෝමෝ සේපියන්ස් සේපියන්ස් (Homo Sapiens Sapiens) මානව අවස්තාව රාම යුගයයේ දැක්වේ. රාජ්‍ය පාලනය, සමාජයේ උසස් පහත් භේදය ඇතිවීම මෙන්ම ග්‍රාමීය ජනයා නාගරීකරණය වීමදක් ද මෙයින් ගම්‍ය වේ. විශාල මාර්ග ඇතිවීම, විශාල ගෘහයන් ඇතිවීම, යාත්‍රාවන් ඇතිවීම ආදියෙන් දියුණු පරිසරයක ලක්ෂණ පෙන්වා දෙනු ලැබේ. හින්දුන්ට අනුව රාමගේ කාලය **'ත්‍රේය යුගය'** වශයෙන් හැඳින්වෙන අතර රාමායනයේ එන ඇතැම් භූගෝලීය හා තාරකා සාධක මත පදනම් කොටගනිමින් ඇතමෙක් ඒ ක්‍රි. පූ. 7000 පමණ කාලය බව දක්වති. ආගමික ග්‍රන්ථ හා විද්‍යාත්මක කාල නිර්ණයන් අතර පරස්පරතා ඇති අතර විද්‍යාත්මක වශයෙන් ඒවා තහවුරු කිරීම අපහසු ය. කාලවකවානු නොබලා රාම තුළ දැක්වෙන ස්වභාවය හා පරිසරය විමසීමේ දී පරිනත බුද්ධියකින් යුතු රණශූරයකු ද වේ. එසේම නාගරීකරණය වූ යුගයක් වශයෙන් ද විස්තර කළ හැකි ය.

**බුද්ධ** - දසාවතාරය තුළ ඇති විශේෂම අවස්ථාවක් ලෙස බුද්ධාවතාර සංකල්පය පෙන්වාදිය හැකි ය. ශාරීරික වෙනස්කම් මෙන්ම බුද්ධිමය වෙනස්කම් අතිශයින් සිදු වු මෙම සමය, වඩාත් කැපී පෙනෙන්නේ බුද්ධිමය පරිණත භාවයට ය. පෙර අවතාර තුළ බුද්ධිමය ප්‍රවණතාවයට වඩා ශාරීරික වෙනස්කම් ප්‍රධාන වූ බව පෙනේ. වර්තමානයේදීත් බුද්ධිමය පරිණාමයේ අති විශිෂ්ට යුගය ලෙස පිළිගැනෙන්නේ උපනිෂද් යුගය යි. එහි අවසන් සමයේ ක්‍රි. පූ. 6 සියවසයේ ගෞතම බුදුන් ලෙස විෂ්ණු පහළ වූ බව වෛෂ්ණව මතය වේ.

තමාගේ අවශ්‍යතාවයන් මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙන් විශේෂ ක්‍රම භාවිතයෙන් හා මානසික දියුණුවෙන් නව සොයා ගැනීම් හා දාර්ශනික අදහස් බිහි වූ කාල පරිච්ඡේදයක් ලෙස ද විවිධ සංකල්ප හා අදහස් අනුව ආගම් දර්ශනවාද ද නිර්මාණය වූ යුගයක් වශයෙන් ද මේ සමය හැඳින්විය හැකි ය. සත්‍ය සෙවීම මුඛ්‍ය පරමාර්ථය කරගත් බොහෝ පිරිසක් නොයෙක් ක්‍රමෝපායන් භාවිතා කරමින් සත්‍යාවබෝධය සඳහා වෙහෙසුණු අතර එහි ප්‍රතිඵල ද ලබාගත් බව පෙනේ (පාලිත හිමි; 2015: 98). බුද්ධිමය පරිණාමයේ උච්චතම අවස්ථාව පෙන්වීමට විෂ්ණු අවතාර අතරට බුද්ධ සංකල්පය ඇතුළත් කොට ඇති බව පරිණාමිය අදහසට අනුව පෙන්වා දිය හැකි ය.

**කල්කි** - කල්කී අනාගත අඳුරු යුගයේ හෙවත් කලියුගයේ පහළ වෙතැයි හින්දුන් විශ්වාස කෙරේ. ධූමකේතුවක් හෝ ගිනිගත් අසිපතක් අතින් ගෙන මිහිපිට පැමිණෙන හෙතෙම අධාර්මිෂ්ඨ වූ ජීවීන් සියල්ල වනසා නව ජීවයකට සුදුසු පරිසරයක් සකසනු ලැබෙත්. එයට උපකල්පනයක් වශයෙන් මෙය දැක්විය හැකි ය.

වසර මිලියන 135ට පමණ පෙර හෙවත් ක්‍රිටේසස් (Cretaceous) අවධියේදී මිහි මත රජ කළ දැවැන්තයන් මෙලොවින් තුරන් වූයේ පොළොවට කඩා හැලෙන උල්කාශ්මයක් හේතුවෙනි. එම ස්වභාවය නැවත සිදුවීම කල්කී වශයෙන් විස්තර වන බව ද සිතිය හැකි ය. ධූමකේතුවක් හෝ ගිනිගත් අසිපතක් අතින් ගෙන පැමිණේ යන්නෙන් එවැන්ක් අදහස් වේ. ඒ අනුව කලියුගය අවසානයේ ලෝකය ගිනි ජාලාවක් වනු ඇති බවද සිතිය හැකි ය (පාලිත හිමි; 2015: 99).

ඩාවින් ඉදිරිපත් කළ මතයට අනුව ස්වභාවික වාරණයට අනුවර්තනය වෙමින් ක්‍රිටේසස් අවදියේ දිවි බේරාගත් සතුන් ඇත. ඒ අතර කිඹුලන්, කටුස්සන්, කැස්බෑවන්, ගෙම්බන් ආදී වේ. ඔවුන්ගෙන් නැවත ජීවය පරිණාමය විය. මේ අනුව කල්කී විනාසයෙන් පසු ශක්තිමත් ජීවින් ඉතිරිව නැවත ප්‍රජනනය වෙමින් පරිණාමය වෙනු ඇතැයි ද සිතිය හැකි ය. විද්‍යාත්මක උපකල්පනයන්ට අනුව පවතින්නා වූ උෂ්ණත්වය ක්‍රම ක්‍රමයෙන් වැඩිවී ශාක සහ ජලය විනාශ විය හැකි බවට අනාවැකි පලකොට ඇත. එය ද කල්කී ස්වභාවයට සමාන වේ. තව ද බුද්ධ දේශනාවේ ඇති සප්ත සුරියෝත්ගමන සූත්‍රයේ ද සප්ත සූර්යයන් පායා ලෝකේ ගිනි ගොඩක් වන බව දක්වා ඇත. මෙම කල්කී සංකල්පයට සමාන ආගමික සහ විද්‍යාත්මක සංකල්පයන් ඉදිරිපත් වී ඇති බව මෙයින් පෙනේ. විස්තරාත්මක ව දක්වන ලද අවතාර සහ විද්‍යාත්මක පරිණාමීය ලක්ෂණ මෙසේ පෙළ ගැස්විය හැකි ය.

| | |
|---|---|
| මත්ස්‍යය | - ජලජ ජීවී අවස්ථාව |
| කූර්ම | - උභය ජීවී අවස්ථාව |
| වරාහ | - ක්ෂීරපායි අවස්ථාව |
| නරසිංහ | - මයෝසීන සමය |
| වාමන | - හෝමෝ ඉරෙක්ටස් |
| පරිශුරාම | - ගල් යුගය / නියන්ඩතාල් |
| ක්‍රිෂ්ණ | - කෘෂිකාර්මික යුගය |
| රාම | - නාගරීකරණය |
| බුද්ධ | - බුද්ධිමය සංවර්ධනය |
| කල්කී | - ලෝක විනාශය |

## නිගමනය

පුරාවිද්‍යාව හෝ ජීව විද්‍යාවක් නොතිබුණු අවධියක නිර්මාණය වූ මෙම දශාවතාර සංකල්පයෙන් මෙවන් වටිනා සංකල්පයක් විද්‍යාමාන වීම විමතිය දනවන කරුණකි. පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරන ජානමය තත්ත්වයක් ඔස්සේ පැමිණෙන සිතිවිලි සමුදායකයන් මෙවැනි අදහස් ගොඩනැගුණු බව උපකල්පනය කළ හැකි ය. එවැනි සිතිවිලි සමාජයට දීමට එකල තිබූ හොඳම ක්‍රමය දෙවියන් ය. එයින් එකල ජනයා තම විඤ්ඤාණයේ සැඟවුණු සංකල්ප දෙවියන් එක්කොට සමාජයට දුන් බව මෙම අවතාර සංකල්පය පැහැදිලි කර ගැනීමෙන් පෙනේ. ආගමික සංකල්පයෙන් ඔබ්බට ගිය විද්‍යාත්මක සංකල්පයක් මෙහි අන්තර් ගතවීම නිසා එය වඩාත් තහවුරු වේ.

## මූලාශ්‍රය


පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (1999), *භාරතීය දර්ශන*, කොළඹ: ගොඩගේ පොත් ප්‍රකාශකයෝ.

පාලිත හිමි, ඊරියතොට. (2015). දස අවතාර සංකල්පයෙන් ගම්‍යවන ජීව පරිණාම වාදය, *විද්‍යාර්ථී ශාස්ත්‍රීය සංග්‍රහ*, මංගල කලාපය. අනුරාධපුර: ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.

රණසිංහ, සමන්චන්ද්‍ර (2016), *අවතරණය*, නුගේගොඩ, විදුදය ප්‍රකාශන.

රේවත හිමි, නවගමුවේ, (2009), *භාරතීය මතවාද විමර්ශනය*, කෙළඹ: ගොඩගේ පොත් ප්‍රකාශකයෝ.

රේවත හිමි, නවගමුවේ, භගවත් ගීතාවෙන් ප්‍රකට වන බුද්ධි විශයාතික්‍රාන්ත දේවවාදය, *චරණ ශාස්ත්‍රීය සංග්‍රහය*, 05 කලාපය, කෝට්ටේ, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

Doniger, W. (1994). *Hindu Myths*. New Delhi: Penguin Books India.

Dwivedi, S. (Com.). (n.d.). *Agnipurāṇam: Hindīvyākhyopetam* (Agnipurana: With Hindi Commentary). Delhi: Chaukhamba Sanskrit Pratishthan.

Holt, J. C. (2008). *The Buddhist Viṣṇu: Religious Transformation, Politics, and Culture*. Delhi: Motilal Banarsidass, pp. 18–21.

Iśvarakṛṣṇa. (1970). *Sāmkhya-Kārikā* (Sāhityācārya Pt. Viśvaprasād Śarmā and Śrī Satkariśarmā Vāṅgīya, Eds.). (Work No. 56, No. 296). The Chowkhamba Sanskrit Series Office.

Jayadeva (1899) *The Gita-Govinda of Jayadeva*: With the Commentaries Rasikapriya of King Kumbha and Rasamanjari of Mahamahopadhyaya Shankara Mishra. Telang, M.R. & Pansikar, W.L. Bombay: Tukârâm Jâvaji, Proprietor of Javaji Dadaji's 'NirṇayaSagara' Press.

Kaushik, A. (ed.) (1993) *Srimad Bhagavad Gita Sanskrit Text, Hindi Translation and English Translation*. 1st edn. New Delhi: Star Publications Pvt. Ltd.

Kṣemendra. (1891). *The Daśâvatâracharita of Kshemendra*. (Durgâprasâd, P. and Kâśînâth Pâṇḍuraṅga Parab, K.). Bombay: Nirṇaya-Sâgara Press.

Pandey, P. S. R. (Pt. Shri Ramtej) (Ed.). (Reprint Edition). *Garudapurāṇa of Krṣṇadvaipāyana Vyāsa* (The Vidyabhawan Prachyavidya Granthamala 3). Varanasi: The Chowkhamba Vidyabhawan.

Vyas, V. (n.d.). Sri harivamsapuraṇa. Gorakhpur: Gita Press.

Wikipedia. Dashavatara. at: [https://en.wikipedia.org/wiki/Dashavatara] (Accessed: 6 October 2025)